# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

### ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි දෙවන පරීක්ෂණය (බාහිර) - 2015

(පැරණි නිර්දේශය)

2021 මාර්තු - 2022 ජනවාරි

මානවශාස්ත්‍ර පීඨය

සිංහල

සංස්කෘතිය ජනශ්‍රැතිය හා භාෂා අධ්‍යයනය SINH E – 2025

සෑම කොටසකින්ම අයත්වන සේ ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.

ප්‍රශ්න සංඛ්‍යාව : 10 යි. කාලය : පැය 03 යි.

---

I කොටස

01. සංස්කෘතිය යනු කුමක්දැ'යි පැහැදිලි කොට භෞතික හා අභෞතික සංස්කෘතීන් අතර පවත්නා සම්බන්ධතාව පිළිබඳ විමසීමක් කරන්න.

02. කුල ක්‍රමය හා සමාජ සංවිධානය අතර පැවැතියේ කෙබඳු සබඳතාවක්දැ'යි නිදසුන් සහිතව පහදන්න.

නැතහොත්

පහත සඳහන් මාතෘකා අතුරින් <u>දෙකක්</u> පිළිබඳ කෙටි සටහන් ලියන්න.

I. සංස්කෘතික අනන්‍යතාව
II. සමාජානුයෝජනය
III. සාරධර්ම
IV. ජනප්‍රිය සංස්කෘතිය

03. භාෂාව හා සංස්කෘතිය අතර පවත්නා අවියෝජනීය සම්බන්ධය පහදන්න.

II කොටස

04. කිසියම් සමාජයක් පිළිබඳ හැදෑරීමකදී ජනශ්‍රැතියෙහි පවත්නා සාමාන්‍ය කාර්යභාරය කෙබඳුදැ'යි පහදන්න.

05. ජනශ්‍රැතියෙහි ප්‍රමුඛාංගයක් වන ජනකවිය මඟින් සාම්ප්‍රදායික ජනජීවිතය පිළිබඳ අධ්‍යයනයට සැපයෙන පිටුබලය කෙබඳුදැ'යි සාකච්ඡා කරන්න.

06. සිංහල දරු නැළවිලි ගීවල පවා ශ්‍රී ලාංකේය ජනජීවිතයේ පිළිබිඹුවක් විද්‍යමාන වෙයි. මේ අදහසට එකඟවිය හැකිදැ'යි විමසන්න.

## III කොටස

07. සිංහල භාෂාවේ සම්භවය සම්බන්ධව පවත්නා විවිධ මත පිළිබඳ විමසීමක් කරන්න.

08. 'පණකුරු පසෙකි එද
ලුහුගුරු බෙයින් දස වේ
ගත කුරු ද වේ විස්සෙක්
වහරට යුහු සියබසැ'

මෙම ගීය නිශ්‍රය කර ගනිමින් සිදත්සඟරා අක්ෂර මාලාව පිළිබඳ විවේචනාත්මක විග්‍රහයක යෙදෙන්න.

09. සිදත්සඟරාවේ ලිංග වර්ගීකරණය පිළිබඳ ඔබේ අදහස් දක්වන්න.

10. අනාගත කාලික ක්‍රියා රූපය පිළිබඳ සිදත්සඟරා කතුවරයාගේ ඉගැන්වීම් විමසුමට ලක්කරන්න.

(එක් ප්‍රශ්නයකට ලකුණු 20 බැගිනි)

*******************************************